# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2394/18 - 2024 ජූලි මස 22 වැනි සඳුදා - 2024.07.22

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

**2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනත**

53 වන වගන්තිය යටතේ වූ නියමය

2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනතේ 53 වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, ආයෝජන ප්‍රවර්ධන අමාත්‍ය රනිල් වික්‍රමසිංහ වන මම, කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාවේ නිර්දේශ සැලකිල්ලට ගෙන සහ අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීමෙන් පසුව, මේ නියමය මගින් -

(අ) අමාත්‍ය මණ්ඩලය විසින් 2024 ජූලි මස 09 වන දින අංක 24/1315/631/034 දරන තීරණය මගින්, මෙහි I වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති බලයලත් තැනැත්තාගේ ව්‍යාපාරය ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ද්විතීයික ව්‍යාපාරයක් ලෙස නම් කිරීම අනුමත කර ඇති බවටත්;

(ආ) ඒ ව්‍යාපාරය ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ව්‍යාපාරයක් - තීරු බදු රහිත සිල්ලර වෙළඳ මෙහෙයුම් ලෙස සැලකීමට හේතු මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති පරිදි වන බවටත්;

(ඇ) පනත් යටතේ ප්‍රදානය කරන ලද නිදහස් කිරීම් හෝ දිරිගැන්වීම් මෙහි III වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති පරිදි විය යුතු බවටත්, සහ

(ඈ) නිශ්චිතව දක්වා ඇති පනත් යටතේ ප්‍රදානය කරන ලද නිදහස් කිරීම් හෝ දිරිගැන්වීම් මෙහි IV වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති දිනවලදී ආරම්භ විය යුතු බවට සහ ක්‍රියාත්මකවීම අවසන් විය යුතු බවටත්,

නිශ්චිතව දක්වමි.

**රනිල් වික්‍රමසිංහ,**
ආයෝජන ප්‍රවර්ධන අමාත්‍ය.

2024 ජූලි මස 19 වැනි දින,
කොළඹ දී ය.

## I වන උපලේඛනය

**ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ව්‍යාපාරයක් - තීරු බදු රහිත සිල්ලර වෙළඳ මෙහෙයුම් ලෙස නම් කර ඇති ව්‍යාපාරයේ විස්තර**

| | |
|---|---|
| 1. බලයලත් තැනැත්තාගේ නම | ඕඩීඑෆ් පීටීඊ එල්ටීඩී<br>(ODF PTE LTD) |
| 2. බලපත්‍ර අංකය | 2303310006 |
| 3. බලපත්‍රය නිකුත් කරන ලද දිනය | 2023 මැයි 17<br>බලපත්‍රය නිකුත් කරන ලද දින සිට මාස 6ක් ඇතුළත වූ දිනයක දී ව්‍යාපාරය ආරම්භ කළ යුතු ය.<br>(2022 අංක 01 දරන බලයලත් තැනැත්තන් ලියාපදිංචි කිරීමේ. බලපත්කරණ, බලය පැවරීමේ හා සෙසු අනුමැතීන් සඳහා වූ නියෝගවල 27 වන නියෝගයට අනුව) |
| 4. අක්වෙරළ සමාගම් ලියාපදිංචි කිරීමේ අංකය | PCC00274746 |
| 5. ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ව්‍යාපාර වර්ගීකරණය | ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ව්‍යාපාරය - තීරු බදු රහිත සිල්ලර වෙළඳ මෙහෙයුම් |
| 6. නිදහස් කිරීම් හෝ දිරි ගැන්වීම් සඳහා හිමිකම | ODF PTE LTD සමාගම ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ව්‍යාපාරයක් - තීරු බදු රහිත සිල්ලර වෙළඳ මෙහෙයුම් ලෙස පමණක් නම් කරනු ලැබ ඇති අතර, එම ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ව්‍යාපාරයක් - තීරු බදු රහිත සාප්පු සංකීර්ණ මෙහෙයුම් වශයෙන් හෝ ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ද්විතියික හෝ ප්‍රාථමික ව්‍යාපාරයක් ලෙස නම් කරනු ලැබීමට සුදුසුකම් නොලබයි. |
| 7. සුදුසුකම් ලැබීමේ නිර්ණායක | 2024 අප්‍රේල් මස 22 වැනි දි අංක 2381/24 දරන අති *විශේෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 2024 අංක 01 දරන කොළඹ වරාය නගරය (ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ව්‍යාපාර සඳහා නිදහස් කිරීම් හෝ දිරි ගැන්වීම් ප්‍රදානය කිරීම පිළිබඳ මාර්ගෝපදේශ - තීරු බදු රහිත මෙහෙයුම්) නියෝගවල 2(3)(අ), (ආ), (ඇ) සහ (ඈ) යන නියෝගවල නිශ්චිතව දක්වා ඇති නිර්ණායක |
| 8. අදාළ වන නිදහස් කිරීම් හෝ දිරිගැන්වීම් යෝජනාක්‍රමය | 2024 අංක 01 දරන කොළඹ වරාය නගරය (ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ව්‍යාපාර සඳහා නිදහස් කිරීම් හෝ දිරිගැන්වීම් ප්‍රදානය කිරීම පිළිබඳ මාර්ගෝපදේශ - තීරු බදු රහිත මෙහෙයුම්) නියෝගවල 3 වන නියෝගයේ නිශ්චිතව දක්වා ඇති යෝජනාක්‍රමය |

## II වන උපලේඛනය

**ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ව්‍යාපාරයක් - තීරු බදු රහිත සිල්ලර වෙළඳ මෙහෙයුම් ලෙස සැලකීමට හේතු**

ව්‍යාපාරය, ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ව්‍යාපාරය - තීරු බදු රහිත සිල්ලර වෙළඳ මෙහෙයුම් ලෙස නම් කිරීමේ දී, 2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනතේ 53(5) වන වගන්තියේ දක්වා ඇති පරිදි, ජාතික යහපත සැලකිල්ලට ගනිමින් හෝ ජාතික ආර්ථිකය දියුණු කිරීම පිණිස කොළඹ වරාය නගරය ස්ථාපිත කිරීමේ සාර්ථකත්වය සහතික කිරීම සඳහා, එකී පනතේ 5 වන වගන්තියේ දක්වා ඇති කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාවේ අරමුණු සැලකිල්ලට ගනු ලැබ ඇත.

ODF PTE LTD සමාගම, FY සමූහයට අනුබද්ධ තීරු බදු රහිත සිල්ලර වෙළඳ කටයුතු සම්බන්ධයෙන් විශේෂඥතාවක් දක්වන සිංගප්පූරුවේ සංස්ථාපිත කරන ලද සමාගමකි. ODF PTE LTD සමාගම විසින්, වර්ග මීටර 8700 ක් පුරා ව්‍යාප්ත සිල්ලර වෙළඳ අවකාශයක් ආවරණය කරමින්, සුප්‍රසිද්ධ සංචාරක ගමනාන්තයක් වන සින්ගපෝර් ෆ්ලයර් (Singapore Flyer) හි පිහිටි තීරු බදු රහිත සාප්පු සංකීර්ණයේ ද සිය මෙහෙයුම් කටයුතු ආරම්භ කිරීමට නියමිතව ඇත.

එක්සත් ජනපද ඩොලර් මිලියන 5.3 ක සෘජු විදේශ ආයෝජනයක් සහ 50 කට වැඩි සේවා නියුක්තයන් පිරිසක් බඳවා ගැනීමත් සමඟ ODF PTE LTD වරාය නගරයේ සිය මෙහෙයුම් ආරම්භ කිරීමට අපේක්ෂා කරයි. බහුවිධ සැපයුම්කරුවන් සහ සන්නාම නාමලත් ආයතන වෙත ප්‍රවේශ වෙමින්, ODF PTE LTD සමාගම විසින් මිල අධික සුඛෝපභෝගී සන්නාම පරාසයක් හඳුන්වාදෙනු ඇති අතර කොළඹ වරාය නගරය තුළ එහි තීරු බදු රහිත සිල්ලර වෙළඳ මෙහෙයුම් සඳහා, ශ්‍රී ලංකාවේ ප්‍රථම වරට භාවිත කරනු ලබන, වර්ධිත තථ්‍යතා ප්‍රවර්ධන (augmented reality promotions) වැනි නව්‍ය ඩිජිටල් සිල්ලර වෙළඳාම් තාක්ෂණය භාවිතයට ගනු ඇත. සිල්ලර වෙළඳාම් කර්මාන්තය තුළ වර්ධිත තථ්‍යතාව යනු තාත්වික ලෝකය සහ පරිගණකයෙන් උත්පාදිත අන්තර්ගතය ඒකාබද්ධ කරන අන්තර්ක්‍රියාකාරී අත්දැකීම් වේ. එම අන්තර්ගතය දෘශ්‍ය, ශ්‍රව්‍ය, ස්පෘශ්‍ය කලා නිර්මාණ (olfactory) වැනි බහුවිධ සංවේදන විධි පරාසයක පැතිරිය හැකිය.

## III වන උපලේඛනය

**පනත් යටතේ ප්‍රදානය කරනු ලබන නිදහස් කිරීම් හෝ දිරිගැන්වීම්**

| පනතේ II වන උපලේඛනයේ ලැයිස්තුගත පනත් | ප්‍රදානය කරනු ලබන නිදහස් කිරීම් හෝ දිරිගැන්වීම් |
|---|---|
| 1. 2017 අංක 24 දරන දේශීය ආදායම් පනත | (අ) සියලු ආදායම්, ලාභ සහ බෙදා දෙනු ලබන ලාභාංශ මෙම පනත යටතේ නිශ්චිතව දක්වා ඇති සියලුම බදු වලින් නිදහස් කරනු ලැබිය යුතුය ;<br><br>(ආ) කරනු ලබන සියලුම ගෙවීම් මෙම පනත යටතේ නිශ්චිතව දක්වා ඇති රඳවා ගැනීමේ බද්දෙන් නිදහස් කරනු ලැබිය යුතුය ; |
| 2. 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත | (අ) කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන ව්‍යාපාර ආශ්‍රිත සියලු භාණ්ඩ හා සේවා ආනයන සහ දේශීය මිලදී ගැනීම්<br><br>(ආ) 2024 අප්‍රේල් 22 හා අංක 2381/24 දරන රජයේ ගැසට් පත්‍රය අනුව අවසරලත් භාණ්ඩ විකිණීම<br><br>මේ පනත යටතේ නිශ්චිතව දක්වා ඇති බදුවලින් නිදහස් කරනු ලැබිය යුතු ය. |
| 3. 2002 අංක 11 දරන මුදල් පනත | මේ පනතේ සියලු විධිවිධානවලින් නිදහස් වන්නේය. |
| 4. 2005 අංක 5 දරන මුදල් පනත | මේ පනතේ සියලු විධිවිධානවලින් නිදහස් වන්නේය. |

| | |
|---|---|
| 5. 1989 අංක 13 දරන සුරා බදු (විශේෂ විධිවිධාන) පනත | (අ) කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන ව්‍යාපාර ආශ්‍රිත සියලු භාණ්ඩ ආනයන සහ දේශීය මිලදී ගැනීම්<br><br>(ආ) 2024 අප්‍රේල් 22 හා අංක 2381/24 දරන රජයේ ගැසට් පත්‍රය අනුව අවසරලත් භාණ්ඩ විකිණීම<br><br>මේ පනත යටතේ නිශ්චිතව දක්වා ඇති සියලු බදු, තීරුබදු සහ අය කිරීම් වලින් නිදහස් කරනු ලැබිය යුතු ය. |
| 6. (235 වන අධිකාරය වූ) රේගු ආඥාපනත | (අ) කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන ව්‍යාපාර ආශ්‍රිත සියලු භාණ්ඩ ආනයන සහ දේශීය මිලදී ගැනීම්<br><br>(ආ) 2024 අප්‍රේල් 22 හා අංක 2381/24 දරන රජයේ ගැසට් පත්‍රය අනුව අවසරලත් භාණ්ඩ විකිණීම<br><br>මේ පනත යටතේ නිශ්චිතව දක්වා ඇති සියලු බදු, තීරුබදු සහ අය කිරීම් වලින් නිදහස් කරනු ලැබිය යුතු ය. |
| 7. 2011 අංක 18 දරන වරාය සහ ගුවන්තොටුපළ සංවර්ධන බදු පනත | (අ) කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන ව්‍යාපාර ආශ්‍රිත සියලු භාණ්ඩ හා සේවා ආනයන සහ දේශීය මිලදී ගැනීම්<br><br>(ආ) 2024 අප්‍රේල් 22 හා අංක 2381/24 දරන රජයේ ගැසට් පත්‍රය අනුව අවසරලත් භාණ්ඩ විකිණීම<br><br>මේ පනත යටතේ නිශ්චිතව දක්වා ඇති සියලු බදු, තීරුබදු සහ අය කිරීම් වලින් නිදහස් කරනු ලැබිය යුතු ය. |
| 8. 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත | (අ) කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන ව්‍යාපාර ආශ්‍රිත සියලු භාණ්ඩ හා සේවා ආනයන සහ දේශීය මිලදී ගැනීම්<br><br>(ආ) 2024 අප්‍රේල් 22 හා අංක 2381/24 දරන රජයේ ගැසට් පත්‍රය අනුව අවසරලත් භාණ්ඩ විකිණීම<br><br>මේ පනත යටතේ නිශ්චිතව දක්වා ඇති සියලු බදු, තීරුබදු සහ අය කිරීම් වලින් නිදහස් කරනු ලැබිය යුතු ය. |
| 9. 1988 අංක 40 දරන ඔට්ටු ඇල්ලීම් සහ සූදු බදු පනත | මේ පනත යටතේ කිසිදු නිදහස් කිරීමක් හෝ දිරි ගැන්වීමක් ප්‍රදානය කරනු නොලැබේ. |
| 10. 1971 අංක 45 දරන කම්කරුවන්ගේ රක්ෂාව අවසන් කිරීමේ (විශේෂ විධිවිධාන) පනත | මේ පනතේ සියලු විධිවිධානවලින් නිදහස් වන්නේය. |
| 11. (267 වන අධිකාරය වූ) විනෝද බදු ආඥා පනත | මේ පනත යටතේ කිසිදු නිදහස් කිරීමක් හෝ දිරි ගැන්වීමක් ප්‍රදානය කරනු නොලැබේ. |
| 12. 2017 අංක 12 දරන විදේශ විනිමය පනත | 2022 ජුනි මස 03 වන දින අංක 2282/59 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද 2022 අංක 01 දරන විදේශ විනිමය (කොළඹ වරාය නගරය තුළ ආයෝජන) නියෝග හැර, මේ පනතේ සියලු විධිවිධාන වලින් නිදහස් වන්නේය. |
| 13. 2010 අංක 17 දරන කැසිනෝ ව්‍යාපාර (නියාමනය කිරීමේ) පනත | මේ පනත යටතේ කිසිදු නිදහස් කිරීමක් හෝ දිරිගැන්වීමක් ප්‍රදානය කරනු නොලැබේ. |

## IV වන උපලේඛනය

### ප්‍රදානය කරනු ලබන නිදහස් කිරීම්වල හෝ දිරිගැන්වීම්වල වලංගු කාලය

| පනතේ II වන උපලේඛනයේ ලැයිස්තුගත පනත් | ආරම්භ වන දිනය | අවසන් වන දිනය |
|---|---|---|
| 1. 2017 අංක 24 දරන දේශීය ආදායම් පනත | 2024 ජූලි 19 | 2044 ජූලි 18 |
| 2. 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත | 2024 ජූලි 19 | 2044 ජූලි 18 |
| 3. 2002 අංක 11 දරන මුදල් පනත | 2024 ජූලි 19 | 2044 ජූලි 18 |
| 4. 2005 අංක 5 දරන මුදල් පනත | 2024 ජූලි 19 | 2044 ජූලි 18 |
| 5. 1989 අංක 13 දරන සුරා බදු (විශේෂ විධිවිධාන) පනත | 2024 ජූලි 19 | 2044 ජූලි 18 |
| 6. (235 වන අධිකාරය වූ) රේගු ආඥා පනත | 2024 ජූලි 19 | 2044 ජූලි 18 |
| 7. 2011 අංක 18 දරන වරාය සහ ගුවන්තොටු පළ සංවර්ධන බදු පනත | 2024 ජූලි 19 | 2044 ජූලි 18 |
| 8. 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත | 2024 ජූලි 19 | 2044 ජූලි 18 |
| 9. 1988 අංක 40 දරන ඔට්ටු ඇල්ලීම් සහ සූදු බදු පනත | අදාළ නොවේ | අදාළ නොවේ |
| 10. 1971 අංක 45 දරන කම්කරුවන්ගේ රක්ෂාව අවසන් කිරීමේ (විශේෂ විධිවිධාන) පනත | 2024 ජූලි 19 | 2044 ජූලි 18 |
| 11. (267 වන අධිකාරය වූ) විනෝද බදු ආඥා පනත | අදාළ නොවේ | අදාළ නොවේ |
| 12. 2017 අංක 12 දරන විදේශ විනිමය පනත | 2024 ජූලි 19 | 2044 ජූලි 18 |
| 13. 2010 අංක 17 දරන කැසිනෝ ව්‍යාපාර (නියාමනය කිරීමේ) පනත | අදාළ නොවේ | අදාළ නොවේ |

EOG 07 - 0225

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.